# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1478/14 - 2007 ජනවාරි 02 වැනි අඟහරුවාදා - 2007.01.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය

සිවිල් ගුවන් සේවා අධිකාරිය

**196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම**

ක්‍රමවත් ගුවන් ප්‍රවාහන සේවාවක් රට තුළ මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පවත්වාගෙන යාම සඳහා කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ, අංක 04-109 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගම විසින් 2006 දෙසැම්බර් මස 28 දාතමින් ඉල්ලුම් පත්‍රයක් එදිනම මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පතට අනුව සීමාසහිත මිහින් ලංකා පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේ ය.

නන්දසේන ගෝඨාභය රාජපක්ෂ මහතා
පුංචි බණ්ඩාර ජයසුන්දර මහතා
එයාර් මාර්ෂල් වෙල්ලාරව්විගේ දොන් රොෂාන් මහේෂ් ජේම්ස් ගුණතිලක මහතා
සජින් ද වාස් ගුණවර්ධන මහතා

එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම් කළමණාකාරිත්වය සඳහා සජින් ද වාස් ගුණවර්ධන මහතා සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගම විසින් නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කොළඹ 03, අංක 64, ගාලු පාරේ, සිවිල් ගුවන් සේවා අධිකාරියේ බිම් මහලේ පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර, ඕනෑම වැඩ කරන දිනක, කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂාකර බැලීමට හැකි ය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතික (Air Operator Certificate) සහ ගුවන් සමාගම් බලපත්‍ර ඇතුළු අනිකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, ගුවන් සංතරණ පනතට මෙන්ම අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ උපදේශ ව්‍යවහාර (International Standard and Recommended Practices) සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරූපදිත වූත්,

ආරක්ෂිත වූත්, කාර්යක්ෂම වූත් සහ විධිමත් මගී ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවෙල 2007 ජනවාරි මස 20 වැනි දින සිට මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10 කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කරගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසි වලට අනුකූලව මා වෙත සංදේශනය කළ හැකිය. එවැනි සංදේශනයන්හි අන්තර්ගත සියලු ප්‍රකාශනවල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය.* එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, ඒ සම්බන්ධව සහතිකයක් අදාළ සංදේශනයට අමුණා තිබිය යුතු ය.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරි.

2007 ජනවාරි මස 02 වැනි දින,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 64,
ගාලු පාර,
කොළඹ 03.

01 - 285

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.